**ක්‍රමලේඛන ව්‍යාපෘති සකස්කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2019**

**-----------------------------------------------------------------**

ක්‍රමලේඛන ව්‍යාපෘති සකස්කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව) අතර 2018 ජනවාරි 30 දින එළඹි මූල්‍ය ගිවිසුම් අත්තිකාරම් අංක : පී - 4910 හි 2 වැනි පරිච්ඡේදයේ 2.05 (ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම් අත්තිකාරමට අනුව, එවකට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති වර්තමානයේ මුදල් අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ වාරිමාර්ග අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයන් වේ. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් වූ මූලික පහසුකම් සැලසීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ණය දෙන ආයතනය මගින් මූල්‍යාධාර සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 4.00 කට සමාන රුපියල් මිලියන 609.55 ක් වූ අතර, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් එම අරමුදලේ සම්පූර්ණ වටිනාකම මූල්‍යනය කිරීම සඳහා එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ජනවාරි 30 දින ආරම්භ කරන ලද අතර, 2020 ජනවාරි 20 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

## 1.3 මතය

මාගේ මතය අනුව මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන් තුළින්, 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු කෙරෙන අතර, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් පිළිබඳ ප්‍රකාශය සහ ඊට අදාළ මුදල් ප්‍රවාහයන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කර ඇත.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකිම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1	නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| අංකය | නීති, රීති සහ රෙගුලාසි ආදිය සඳහා යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශයන් |
| --- | --- | --- | --- | --- | --- |
| ------ | ----------------- | ------------------ | --------- | -------------------- | ---------------- |
| (අ) | මුදල් රෙගුලාසි අංක 134(3) සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 | සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ සිදුවූ ගණුදෙනු කිසිවක් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණන කටයුතුවලට භාජනය කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන උපක්‍රම නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි විය හැක. | මුදල් රෙගුලාසි අංක 134(3) සහ කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 හි සඳහන් උපදෙස් ප්‍රකාරව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ (පී.පී.පී.එෆ්) අභ්‍යන්තර විගණන කටයුතු 2019 වර්ෂය තුළදී සිදුකර තිබුණි. පී.පී.පී.එෆ් ව්‍යාපෘතියේ ප්‍රගතිය හා එම ව්‍යාපෘතිය සම්බන්ධ ගැටළු පිළිබඳව, 2019 වර්ෂය තුළ පැවැත්වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. | ව්‍යාපෘතියේ ගණුදෙනු පිළිබඳව වූ විගණන කටයුතු අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකළ යුතු වේ. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛයේ 09 වැනි වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු ඵලදායී ආකාරයෙන් සිදුකිරීමට නොහැකි විය හැක. | ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය, වෙනත් ව්‍යාපෘතිවලට සමාන ව්‍යාපෘතියක් නොවන අතර, ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල, පෙර සූදානම් කිරීමේ අදියරෙහි පවතින කටයුතු පිළිබඳව සම්බන්ධීකරණ කාර්යයන් සිදුකරනු ලැබේ. එම නිසා ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම යටතේ ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් රේඛීය අමාත්‍යාංශ විසින් සාමාන්‍ය | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. |

පරිදි ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වනු ලැබේ. ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය සම්බන්ධීකරණ හස්තයක් ලෙස ක්‍රියාකරන බැවින් එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ ඔවුන් මුහුණ දෙන ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා, අවශ්‍ය අවස්ථාවලදී රැස්වීම් පැවැත්වීමේ කටයුතු සිදුකරනු ලැබේ.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| ව්‍යාපෘති සංරචක | විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| ---------------- | ----------------- | --------- | ------------------ | ----------------- |
| (ආ) රාජ්‍ය අංශය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය<br><br>(ආ) වෙිලි ආරක්ෂණය හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය<br><br>(ඇ) පළාත්බද මාර්ග සංවර්ධන වැඩසටහන | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙතින් ලද තොරතුරුවලට අනුව, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ව්‍යාපෘති 09 ක් සකස් කිරීම වෙනුවෙන් මූල්‍ය ආධාර සැපයීම තුලින් මූලික පහසුකම් සැලසීම, ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ඉහත ව්‍යාපෘති 09 න් ව්‍යාපෘති 03 ක ක්‍රියාකාරකම්, පෙර වර්ෂයේදී ක්‍රියාත්මක කොට තිබුණු අතර, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ මූලික පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුලදී | ව්‍යාපෘතියේ මූලික අරමුණ කරා ලඟා වී නොමැත. | 2017 -2019 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වශයෙන් ව්‍යාපෘති නවයක් හඳුනාගෙන තිබූ අතර, එය එක් වර්ෂයක් ඉකුත්වීමෙන් පසු, 2018 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මේ වනවිට ව්‍යාපෘති 07 ක් තෝරාගෙන තිබුණු අතර, දැනටමත් සවිස්තරාත්මක සැලසුම් සකස් කර ඇත. කෙසේ වෙතත්, සමහර ව්‍යාපෘති වෙනුවෙන් ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම් අරමුදල් භාවිතා කර නොතිබුණි. නමුත් ව්‍යාපෘති සකස් කිරීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට සහ අදාළ අනෙකුත් රජයේ ආයතනවලට ඔවුන්ගේ තාක්ෂණික | ව්‍යාපෘතියේ අරමුණු ව්‍යාපෘති කාලය තුලදී සාක්ෂාත් කරගැනීම සඳහා පියවර ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය<br><br>(ඉ) ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සහාය වීමේ වැඩසටහන<br><br>(ඊ) අහිතකර දේශගුණික බලපෑම්වලට යෝග්‍ය කෘෂි - වාරි සංවර්ධන ව්‍යාපෘතිය<br><br>(උ) පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වයට අවශ්‍ය ආයතනික හා නෛතික රාමු සවිබල ගැන්වීම. | ආරම්භ කර තිබුණි. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව, 2018 වර්ෂයේදී විදේශ අරමුදල් සැපයීමට අපේක්ෂිත විදේශ ව්‍යාපෘති 04 ක් හඳුනාගෙන ඒ සඳහා සවිස්තරාත්මක සැලසුම් ද සකස් කොට තිබුණු අතර, ව්‍යාපෘති 03 කට අදාළව ලෝක බැංකුව සමඟ ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණි. ඉතිරි ව්‍යාපෘති 02 සඳහා පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම ප්‍රමාද කර තිබුණි. | | දැනුම ලබාදී ඇත. ව්‍යාපෘති 02 ක කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද කර ඇත.<br>තවදුරටත්, රජයේ ප්‍රමුඛතා වෙනස් කිරීම හේතුවෙන් සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින් ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන, මෙම ලේඛනයේ සඳහන් ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීමේ අනුපිළිවෙල, රජයේ අවශ්‍යතා සහ ප්‍රමුඛතා අනුව වෙනස්විය හැකි බවද මෙහිදී සටහන් කෙරේ. | |

**3.2 ඌණ උපයෝජිත සම්පත්**

| අංකය | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| ------- | ---------------- | --------- | ---------------- | --------------------------- |
| (i) | අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති අපේක්ෂිත මූල්‍ය ඉලක්කවලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට එක්සත් ජනපද ඩොලර් මිලියන 04 කට සමාන රුපියල් මිලියන 609.55 ක | උපයෝජනය නොකළ ශේෂය වෙනුවෙන් වූ බැඳීම් ගාස්තු ලෙස, රුපියල් මිලියන 11.51 ක මුදලක් ගෙවීමට ශ්‍රී ලංකා රජයට | 2019 මුදල් වර්ෂය තුළදී බැඳීම් ගාස්තු අයකර නොමැත. | සුදුසු මූල්‍ය සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදලක් වැය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, එක්සත් ජනපද ඩොලර් මිලියන 0.37 කට සමාන රුපියල් මිලියන 64.07 ක ඉලක්කයක් පමණක් එනම්, එම ඉලක්කයෙන් සියයට 9.25 ක ප්‍රතිශතයක් පමණක් 2019 දෙසැම්බර් 31 දින වනවිට ලබා කරගෙන තිබුණි. | සිදුවී ඇත. | | |
| (ii) | රුපියල් මිලියන 325 ක්වූ සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක ප්‍රතිශතයක් පමණක් එනම්, රුපියල් මිලියන 39 ක් පමණක් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි. | ණය ප්‍රමාණය මත ලැබෙන අරමුදල්වලින් ඵලදායී ලෙස භාවිතා නොකරන ලද ප්‍රතිපාදනවල ඌණ උපයෝජනය | ප්‍රතිපාදන ඌණ උපයෝජනය කිරීමට හේතුවූ කරුණු පහත සඳහන් කෙරේ.<br>(අ) අයවැය චක්‍රලේඛ අංක 4/2019 සහ 5/2019 අනුව, රුපියල් මිලියන 84 ක (මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25% ක ප්‍රතිශතයක්) ප්‍රතිපාදන, අනිවාර්ය ඉතිරිකිරීම් සඳහා වෙන්කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ශුද්ධ ප්‍රතිපාදනය, රුපියල් මිලියන 325 සිට රුපියල් මිලියන 241 දක්වා පහත හෙලා තිබුණි.<br><br>(ආ) ව්‍යාපෘති තුනක් සඳහා සැලසුම් කරන ලද කාලවකවානුවට පෙර ණය ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත වියදම් සිදුකිරීමට නොහැකි වී තිබුණි. | අරමුදල් ඵලදායී ආකාරයෙන් භාවිතා කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු වේ. |

(ඈ) පෙර සූදානම් කිරීමේ කටයුතු බොහොමයක්, අදාළ රාජ්‍ය නිලධාරින් විසින්ම සිදුකරන ලද බැවින්, ණය වෙනුවෙන් ලද අරමුදල් අපේක්ෂිත පරිදි උපයෝජනය කළ නොහැකි විය.

(ඇ) රජයේ ප්‍රමුඛතාවන් වෙනස් කිරීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි විය.

(ඉ) රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ වූ සීමාකාරී බව හේතුවෙන්, සමහර ව්‍යාපෘතිවල අදියරයන් ඉවත් වී තිබුණි.